සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

8 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 50 S

නම .............................................. නාට්‍ය හා රංග කලාව I කොටස කාලය පැය දෙකයි

උපදෙස් ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න,
අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) පෙළ රචනයෙහි අත්‍යවශ්‍ය අංගයක් නොවන්නේ,
(1) ගැටුම (2) සංවාද (3) තේමාව (4) සංගීතය

(2) කටහඬ අභ්‍යාස පුහුණු කිරීමෙහිලා උපයෝගී කොටගත හැකි ග්‍රන්ථයක් නොවන්නේ,
(1) බුද්ධ ගජ්ජය (2) සකස්කඩ
(3) නම්පොත (4) නවකවි සරණිය

(3) ජනගීත වලට අයත් නොවන්නේ,
(1) භක්ති ගීත (2) යාතුකර්ම ගීත
(3) වැදි ගීත (4) ගොයම් කවි

(4) ළමා නාට්‍යයක් සඳහා නිදසුනක් නොවන්නේ,
(1) පොල්ගෙඩියට ජරමරේ (2) අමරගියා දිව්‍යලෝක
(3) කඳාවළලු (4) පුංචි අපට දූන් තේරෙයි

(5) ජාතක කතා ඇසුරින් නිර්මාණය වූ නාට්‍යයකි,
(1) මනමේ (2) විකෘති
(3) නෙළුම් කුමාරි (4) කැළණි පාලම

✶ අංක 06 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රකාශනයන් හරි නම් ( ✓ ) ලකුණ ද වැරදි නම් ( x ) ලකුණද වරහන් තුළ යොදන්න.

(6) නාට්‍ය ගීත ආවේණික නාද මාලාවට අනුව ගායනා කරයි. ( )
(7) නාට්‍ය පෙළින් ප්‍රකාශිත අදහස තේමාව ලෙස හැඳින්විය හැකිය. ( )
(8) "ගැටුම" නාට්‍යයක තිබිය යුතු අත්‍යවශ්‍යම අංගයක් නොවේ. ( )
(9) නාට්‍යය පෙළක් සාර්ථක වීම සඳහා රචකයාගේ පරිකල්පන ශක්තිය ප්‍රබල ලෙස බලපායි. ( )
(10) වේදිකා නාට්‍යයක් නැරඹීමෙන් ජීවිතයට අත්දැකීම් බොහෝමයක් එක් කරගත හැකිවේ. ( )

✶ අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.
(අධ්‍යක්ෂකවරයා, ප්‍රේක්ෂකයා, සැහැල්ලුව, චරිත, නාට්‍යෝචිත, නිෂ්පාදකවරයා,)

(11) කථාවක් කියවන්නා පාඨකයා වන අතර නාට්‍ය නරඹන්නා ..................................... ලෙස හැඳින්වේ.
(12) කතා වස්තුවක අවස්ථා හා සිද්ධි තුළ ඇති ක්‍රියා ප්‍රේක්ෂකයන් හමුවට පමුණුවන්නේ ............................ විසිනි.
(13) නාට්‍ය පිටපත තුළ ඇති රංගවිධාන අනුව නළු නිළියන් වේදිකාව මත හසුරුවන්නේ ...................................... විසිනි.
(14) ශිථිලිකරණ අභ්‍යාස සිදුකිරීමෙන් ශරීරයට ............................. ඇති වේ.
(15) නාට්‍ය පෙළක අනිවාර්යෙන්ම .................................. අවස්ථා දැක ගත හැකිය.

✶ අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පහත සඳහන් ප්‍රහේළිකාව සම්පූර්ණ කරන්න.




<u>හරහට</u>

(16) යමෙක් කරන දෙය ඒ ආකාරයෙන්ම කර පෙන්වීම මේ නමින් හැඳින්වේ.

(19) චරිතයට උචිත ලෙස මුහුණ හැඩ ගැන්වීම (මේකප් කිරීම) මේ නමින් හැඳින්වේ.

(20) රංග අභ්‍යාස කිරීමෙන් මෙම තත්වය දුරුකරගත හැක.

<u>පහළට</u>

(17) පාලිත ලොකුපෝතාගම විසින් රචිත නාට්‍යයකි.

(18) කායික හා මානසික සමබරතාවය ඇතිකර ගැනීම සඳහා රංග ශිල්පියෙකු විසින් කරනු ලබන ප්‍රායෝගික පුහුණුවීම් කුමන නමකින් හඳුන්වයිද? (ල. 20)

## II කොටස

**පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.**

(1) A :- මං කැවේ ඒ වෙලාවේ මං හොඳටම බඩගිනි වෙලා හිටියේ.

B :- (ඇද කරමින්) මං කැවේ....... එතකොට මට බඩගිනි නැද්ද? කැලේ ඇවිදලා මහන්සියට කන්න තිබුණ මී වද කැල්ල. කමක් නෑ.......... මගේ ගෙදර වැඩ කර ගන්න කෙල්ලෙක් ලැබුණා. දැන් මෙහේ තියෙන වැඩක් කරගෙන ඉන්න පුළුවන්.

A :- (අඬමින්) අනේ වලස් රාළහාමි ........ මට ගෙදර යන්න ඕනෑ. මගෙ ආච්චි මං එනකන් බයේ ඇති අනේ.........

B :- (ඇද කරයි) ඈ......../// හොහ්...... හොහ්.......

I ඉහත සංවාද ඛණ්ඩය ඇතුලත් නාට්‍ය නිර්මාණයේ නම කුමක් ද? (ල. 02)

II එම නාට්‍යයෙහි නිර්මාණකරු නම් කරන්න. (ල. 02)

III ඉහත අවස්ථාව තුළ වේදිකාව මත සිටින චරිත නම් කරන්න. (ල. 02)

IV මෙහි ඇතුළත් රංග විධාන දෙකක් ලියන්න. (ල. 02)

V ඔබ දන්නා ළමා නාට්‍ය දෙකක් නම් කරන්න. (ල. 02)

(2)

I රංග අභ්‍යාස යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

II රංග අභ්‍යාස වර්ග 4 ක් නම් කරන්න. (ල. 04)

III රංග අභ්‍යාස වල නිරත වීමෙන් ලැබෙන ප්‍රයෝජන 4 ක් ලියන්න. (ල. 04)

(3)

I නාට්‍ය ගීත ගායනයේදී ඔබ විසින් සැලකිලිමත් විය යුතු කරුණු 5 ක් ලියන්න. (ල. 05)

II ඔබ දන්නා නාට්‍ය ගීයක් ලියා දක්වන්න. (ල. 05)

(4)

I ඉග්නේෂස් ලොයෙලා මුණිවරයාගේ කතාව තේමා කොට ගෙන නිර්මාණය කළ සුප්‍රසිද්ධ නාට්‍ය සහ එහි නිර්මාණකරු නම් කරන්න. (ල. 04)

II පහත නාට්‍ය නිර්මාණ සඳහා ඇසුරු කොට ගත් ජාතක කථා නම් කරන්න.

I කදා වළලු -
II පබාවති -
III මනමේ -
IV වෙස්සන්තර -
V ලෝම හංස -
VI සඳ කිඳුරු - (ල. 06)

(5) ඔබ දන්නා සුරංගනා කතාවක් හෝ ජන කතාවක් ඇසුරු කොට ගෙන සරල නාට්‍ය පෙළක් රචනා කරන්න. (පෙළක් තුළ අන්තර්ගත වන මූලික අංග පිළිබඳව සැලකිලිමත් වන්න.) (ල. 10)

**පළමු වාර පරීක්ෂණය - 2019**
**8 ශ්‍රේණිය**
**නාට්‍ය හා රංග කලාව පිළිතුරු පත්‍රය**

**I කොටස**

1. සංගීතය
2. නවකවි සරණිය
3. භක්ති ගීත
4. කදා වළලු
5. මනමේ
6. ✓
7. ✓
8. ×
9. ✓
10. ✓
11. ප්‍රේක්ෂකයා
12. චරිත
13. අධ්‍යක්ෂකවරයා
14. සැහැල්ලුවක්
15. නාට්‍යෝචිත
16. අනුකරණය
17. අමර ගියා දිව්‍යලෝක
18. අංග අභ්‍යාස
19. අංග රචනය
20. සබකෝලය (ල.20)

**පිළිතුරු පත්‍රය II කොටස**

(1)

I වලහා සහ මාෂා (ල. 2)

II ඩී. කුමාරගේ (ල. 2)

III වලහා , මාෂා (ල. 2)

IV (අඬමින්) (ඇද කරමින්) (ඇද කරයි) (ල. 2)

V අමර ගියා දිව්‍යලෝකේ, නෙළුම් කුමාරි, තොප්පි වෙළෙන්දා ආදී වශයෙන් (ල. 2)

(ල. 10)

(2)

I රංගනයේ යෙදෙන ශිල්පීන් තම කායික හා මානසික යෝග්‍යතාවය ඇති කර ගැනීම සඳහා කරන අභ්‍යාස (ල. 2)

II ශිථිලීකරණ අභ්‍යාස, හඬ අභ්‍යාස, චලන අභ්‍යාස, සංවේදන අභ්‍යාස, ආදී වශයෙන් (ල. 4)

III නිවැරදි ලෙස ප්‍රයෝජන දක්වා ඇති විට ලකුණු ලබා දෙන්න. (ල. 4)

(ල. 10)

(3)

I නියමිත තනුව, තාලය, නිවැරදි වචන උච්චාරණය, ශ්‍රැති පිහිටුවා ගායනය කිරීම, භාව ප්‍රකාශන සහිතව ගායනය කිරීම, හඬ පාලනය, වේදිකාවට උචිත ලෙස ගායනය කිරීම (ල.5)

II නිවැරදි ලෙස සම්පූර්ණ ගීතය ලියා ඇති විට ලකුණු ලබා දෙන්න. (ල. 5)

(ල. 10)

(4)

I සාන්තුවර සෙබළානෝ - සුගතපාල ද සිල්වා (ල. 4)

II 1) සේරිවාණිජ ජාතකය
2) කුස ජාතකය
3) චුල්ල ධනුද්ධර ජාතකය
4) වෙස්සන්තර ජාතකය
5) ලෝමහංස ජාතකය
6) සඳකිඳුරු ජාතකය (ල. 6)

(ල. 10)

(5) චරිත, සංවාද, රංග විධාන සහිතව නාට්‍යෝචිතව පෙළ රචනා කර ඇති විට ලකුණු ලබා දෙන්න.

(ල. 10)